# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
## இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
## HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date: 2022-10-18 |

පැමිණිලි පාර්ශවය : 01. ආර්.එම්. සුමිත් තිලකසිරි මයා,
14 ඒ, දොඩම්වල පටුමග,
ශ්‍රීමත් කුඩා රත්වත්ත මාවත,
මහනුවර.

02. ආර්. ධර්මසේන මයා,
380/ඩී, මහවත්ත,
හන්දෙස්ස.

වගඋත්තර පාර්ශවය : ආයතන අධ්‍යක්ෂ ජනරාල්,
රාජ්‍ය පරිපාලන අමාත්‍යංශය,
නිදහස් චතුරශ්‍රය.
කොළඹ 07.

<u>පැමිණිලි අංකය</u> : **<u>HRC/K/651/18</u>**

**පැමිණිල්ලේ සැළකිරීම :-**

ඉහත පැමිණිලිකාර ආර්.එම්. සුමිත් තිලකසිරි යන අය විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ, තමා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ රාජ්‍ය කළමණාකාර සහකාර තනතුරේ සේවයේ සිට 2009 වර්ෂයේ විශ්‍රාම වැටුප් ලබමින් සිටින අතර, තමා විසින් තොරතුරු ලබාගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත යටතේ ලබාගත් අමාත්‍ය මණ්ඩල පත්‍රිකා හා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 20/94 පරීක්ෂා කිරීමේදී 1994 මැයි 11 දිනැති අමප/94/550/003 දරණ තීරණයට පටහැනිව ඉහත චක්‍රලේඛය නිකුත් කර ඇති බවත්, ඒ හේතුවෙන් තමාට 1994.05.11 දිනැති

අමපප/94/550/033 දරණ අනුමැතිය පරිදි 1994.06.01 දින සිට තමාට හිමිවිය යුතු එස් 5-1 වැටුප් පරිමාණය ලබා ගැනීමට තමා වෙත තිබූ හිමිකම අහිමි වී ඇති බවත්ය.

පැමිණිලිකාර ආර්. ධර්මසේන මහතා විසින් සිය පැමිණිල්ල මගින් දක්වා ඇත්තේ, මහනුවර කම්කරු විනිශ්චය සභාවේ රාජ්‍ය කළමණාකරන සහකාර ලෙස සේවයේ යෙදී සිට, 2006 වසරේ පමණ විශ්‍රාම ගිය අතර, තමන්ගේ වැටුප 1994 වසරේ සිට සංශෝධනය විය යුතු බවට තොරතුරු දැනගැනීමේ කොමිසමෙන් දැනගත් බවත් ඒ අනුව මෙම පැමිණිල්ල මානව හිමිකම් කොමිෂන් සභාව වෙත යොමු කරන ලද බවයි. ඒ අනුව 1971-1976 දක්වා කාලය තුළ උපාධිධාරී අභ්‍යාසලාභී ක්‍රමය යටතේ බඳවාගනු ලැබූ නිලධරයන්ට වැටුප් සකස් කිරීම සඳහා 1994-05-11 දිනැති අමා/94550/003 අමාත්‍ය මණ්ඩල තීරණ නිසි පරිදි ක්‍රියාත්මක නොකර 1994-06-15 නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 20/94 නිකුත් කිරීම තුළින් තම අයිතිවාසිකම් කඩ වී ඇති බවයි.

පෙර කී අමාත්‍ය මණ්ඩල අනුමැතිය වන්නේ, 'අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත 94/550/033 හි 1971-1976 දක්වා කාලය තුළ උපාධිධාරී අභ්‍යාස යෝජනා ක්‍රමය යටතේ බඳවාගත් නිලධාරී' යන මැයෙන් රාජ්‍ය පරිපාලන අමාත්‍යවරයා ඉදිරිපත් කළ 1993-12-29 දින සංදේශය අනුව 1971-1976 අතර කාලය තුළදී උපාධිධාරී අභ්‍යාස යෝජනා ක්‍රමය යටතේ බඳවා ගැණුනු අය සඳහා යෝග්‍ය තනතුර සොයා දෙන තෙක් ඔවුන්ට පෞද්ලික වන සේ තාවකාලික පියවරක් ලෙස S 5-1 වැටුප් පරිමාණ වන (රු 49200-12×1560=72000) තම වැටුප් ප්‍රමාණය) සියලුම උපාධිධාරීන්ට ව්‍යාප්ත කිරීම පිණිස සංදේශයේ බී මනාපය ක්‍රියාත්මක කළ යුතු යන්නයි.

ඊට පාදක වූ 1993-12-29 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයේ බී නිර්දේශය පහත පරිදි වේ.

1. උපාධිධාරී අභ්‍යාසලාභී සියලු දෙනා උපාධිධාරී අභ්‍යාසලාභී සේවයට අන්තර්ග්‍රහනය කර S 3-8 වැටුප් පරිමාණය ලබා දීම හා ඔවුන් සේවය කරන අමාත්‍යාංශ දෙපාර්තමේන්තුවල තනතුරු නොසලකා මෙම වැටුප් ලබාදීම.

2. සැලසුම් ක්‍රියාත්මක කිරීමේ නිලධාරී නතතුරු වලට සමාන්තර තනතුරු වලට 1971 පෙර බඳවාගත් උපාධිධාරීන්,
   (අ) 1971-1977 අතර බඳවාගත් අභ්‍යාසලාභී නොවන උපාධිධාරීන්
   (ආ) 1977 පසු උපාධිධාරී ස්ථාපන සේවය යටතේ බඳවා ගත් වසර 15 ට වැඩි සේවා කාලයක් ඇති අය, මෙම යෝජනා ක්‍රමය යටතේ සහන ලැබීමට සුදුස්සන් වේ.

එකී අමාත්‍ය මණ්ඩල සංදේශය හා අමාත්‍ය මණ්ඩල තීරණය එසේ තිබියදී 1994.06.15 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛන 2094 මඟින් එම අමාත්‍යමණ්ඩල සංදේශය හා අනුමැතිය අභිබවා කටයුතු කරමින්, එකී චක්‍රලේඛ 2(අ) මඟින් 1971-1976 අතර බඳවාගත් අභ්‍යාසලාභී උපාධිධාරීන් ඔවුන්ට යෝග්‍ය තනතුරු සොයාදෙන තෙක් ඔවුන්ට පෞද්ගලික වන සේ සහ තාවකාලික පියවරක් ලෙස S 5-1 වැටුප් පරිමාණයේ පිහිටුවීමටත් එකී චක්ලේඛ 2(ආ) අනුව 1971 ට පෙර සැළසුම් ක්‍රියාත්මක කිරීමේ නිලධාරී තනතුරුවලට බඳවාගත් උපාධිධාරීන්ට හා 1971/1977 අතර බඳවාගත් අභ්‍යාසලාභී නොවන උපාධිධාරීන් හා 1977ට පසු උපාධිධාරී ස්ථාපන සේවය යටතේ බඳවාගත් වසර 15ටවැඩි සේවා කාලයක් ඇති උපාධිධාරීන් යන කාණ්ඩ අනුව S 3-8 වැටුප් පරිමාණ ලබා දීමට කටයුතු කර ඇති බැවින් තමන් දෙදෙනාගේ අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බව පැමිණිල්ලෙන් වැඩිදුරටත් සඳහන් කර ඇත.

**වගඋත්තරපාර්ශවීය සැළකිරීම් :-**

රාජ්‍ය සේවා ලිපිකාර හා සමාන්තර සේවාවන් හි ඌන සේවා නියුක්ති උපාධිධාරීන්ට සහන සැළසීම 1971-1976 දක්වා කාලය තුළ උපාධිධාරී අභ්‍යාසලාභී යෝජනා ක්‍රමය යටතේ බඳවාගනු ලැබූ නිලධාරීන්ට සහන සැළසීම සඳහා 1994.06.15 දින 20/94 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 20/94 නිකුත් කරන ලද බවත්, එම චක්‍රලේඛය1994 මැයි 11 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මත සිදුකර ඇති අතර, 1993.12.29 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයේ බී නිර්දේශ මඟින් යෝජනා කර තිබූ පළමු යෝජනාව උපාධිධාරී අභ්‍යාසලාභී සියලුදෙනාට S 3-8 වැටුප් පරිමාණය වෙනුවට S 5-1 වැටුප් පරිමාණයත්, අනෙක් නිලධාරීන් හට (බී)නිර්දේශය සඳහා S 3-8 වැටුප් පරිමාණයත් ඇතුළත් කර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 20/94 චක්‍රලේඛනය නිකුත් කර ඇති බවයි. එකී චක්‍රෙල්ඛනය ප්‍රකාරව කටයුතු කර ඇති බැවින් ඉන් පැමිණිලිකරුවන්ට කිසිඳු අසාධාරණයක් සිදුවී නොමැති බව සඳහන් කර ඇත.

**නිරීක්ෂණය :-**

පැමිණිල්ලේ මූලික ගැටලුව වනුයේ ,1971 සිට 1976 දක්වා කාලය තුළ උපාධිධාරී අභ්‍යාසලාභී යෝජනා ක්‍රමය යටතේ බඳවාගනු ලැබූ නිලධාරීන්ට 1993.12.29 වන දින අමාත්‍ය මණ්ඩල සංදේශයේ (බී) නිර්දෙශය ක්‍රියාත්මක කරන ලෙස සඳහන් කර එය 1994.05.11 වන දින අමාත්‍ය මණ්ඩල තීරණයෙන් ද නියෝග කර තිබියදී 1994.06.15 දින 20/94 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛන මඟින් එය සංශෝධනයන් කොට, එක් කොටසකට පමණක් සහන සැලසීම මඟින් පැමිණිලිකරුගේ අයිතිවාසිකම් කඩවී ඇති බවත්, ඒ පිළිබඳ රාජ්‍ය පරිපාලන හා ආපදා කළමණාකරන ආයතන කටයුතු අමාත්‍යාංශයේ (වැ.බ) අධ්‍යක්ෂක ජනරාල්ගේ ඊඑස්ටී 5/7/3/43-11 හා 2019.02.08 දිනැති වාර්තාවෙන් නිරීක්ෂණය වේ.

1971-1977 කාලය තුළ උපාධිධාරී අභ්‍යාසලාභීන් ලෙස බඳවාගෙන විවිධ අමාත්‍යංශ හා දෙපාර්තමේන්තුවලට අනුයුක්ත කරන ලද උපාධිධාරී ඒ ඒ තනතුරු වල වැටුප් ලබමින් සිටියදි එම කාලය තුළ උපාධිධාරීන් අභ්‍යාසලාභීන් ලෙස බඳවා ගත් සැලසුම් ක්‍රියාත්මක කිරිමේ නිලධාරීන් 1992.05.27 වන දින අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි ශ්‍රී ලංකා සැලසුම් සේවයේ 11-11 ශ්‍රේණියට පත් කර වැටුප ගෙවා ඇති අතර, එම වැටුප් ක්‍රමයම ලබාදෙන ලෙස ඉතිරි අභ්‍යාසලාභීන් කරන ලද ඉල්ලීම අනුව 93/600/031 හා 1993.03.24 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ අනුව 1971-1977 දක්වා කාලය තුළද උපාධිධාරී අභ්‍යාසලාභී යෝජනා ක්‍රම යටතේ බඳවාගත් නිලධාරීන්ගේ වැටුප් පිළිබඳ ඉල්ලීම වැටුප් හා සේවක සංඛ්‍යා කමිටුව වෙත යොමු කිරිමෙන් අනතුරුව එම කමිටු නිර්දේශ 'ඒ', 'බී', 'සී' ලෙස නිර්දේශ තුනක් ලබා දී ඇත. එකී නිර්දේශ තුනෙන් පැමිණිලිකරුට අදාළ 'බී' නිර්දේශය පහත පරිදි වේ.

01 උපාධිධාරී අභ්‍යාසලාභීන් සියළු දෙනා උපාධිධාරී අභ්‍යාසලාභී සේවය කර අන්තර්ග්‍රහණය කොට එස් 3-8 වන රුපියල් 45120-10 x 1200-57120 වැටුප් පරිමාණ ලබාදීම. ඔවුන් සේවය කරන අමාත්‍යංශ දෙපාර්තමේන්තු තනතුරු නොසලකා මෙම වැටුප් ක්‍රමය ලබා දිය හැකි බවද දක්වා ඇත.

1. සැලසුම් ක්‍රියාත්මක කිරිමේ නිලධාරී තනතුරු වලට සමාන්තර තනතුරු බවට 1971ට පෙර බඳවාගත් උපාධිධාරීන්,
2. 1971-1977 අතර බඳවා ගත් අභ්‍යාසලාභී නොවන උපාධිධාරීන්,
3. 1977ට පසු උපාධිධාරීන් ස්ථාපන සේවය යටතේ බඳවාගත් අවුරුදු 15 කට වැඩි සේවා කාලයක් ඇති උපාධිධාරීන් මෙම යෝජනා ක්‍රමය යටතේ සහන ලැබීමට සුදුස්සන් වේ. යන්න දක්වා ඇත.

ඉහත "බී" නිර්දේශ 3 හි '1977ට හා උපාධිධාරීන් ස්ථාපන සේවය යටතේ බඳවා ගත් වසර 15කට වැඩි සේවා කාලයක් ඇති උපාධිධාරීන්' යන්න පැමිණිලිකරුවන්ට අදාළ වේ.

අනතුරුව නිකුත් කරන ලද 1994.05.11 දින අමාත්‍ය මණ්ඩල තීරණ 41.22 අමාත්‍ය මණ්ඩල පත්‍රිකා, 94/550/003 වූ, "1971-1976 දක්වා කාලය තුල උපාධිධාරී අභ්‍යාස යෝජනා ක්‍රමය යටතේ බඳවා ගනු ලැබූ නිලධාරීන් "යන මැයෙන් රාජ්‍ය පරිපාලන ඇමතිතුමා ඉදිරිපත් කළ 1993.12.29 දිනැති සංදේශය සලකා බලා, 1971 සහ 1976 අතර කාලය තුළදී උපාධිධාරී අභ්‍යාස යොජනා ක්‍රමය යටතේ බඳවා ගනු ලැබූ අය සඳහා යෝග්‍ය තනතුරු සොයාදෙනු ලබනතෙක්, ඔවුන්ට පෞද්ගලික වනසේ සහ **<u>තාවකාලික පියවරක් වශයෙන්</u>** එස් 5-1 වැටුප් පරිමාණය වන රු. 49,200 -12 x 1,560 -72,600 (නව වැටුප්

පරිමාණය ) සියළුම උපාධිධාරීන්ට ව්‍යාප්ත කිරීම පිණිස සංදේශයේ ''බී'' මනාපය ක්‍රියාත්මක කළ යුතුයැයි තීරණය කර ඇත.

එසේ උපදෙස් ලබා දී තිබියදී රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය විසින් 20/94 චක්‍රලේඛනය 1994.06.15 දින නිකුත් කර ඇති අතර, එහි (අ) (ආ) සඳහන් වී ඇත්තේ මොවුන්ට පෞද්ගලික වන සේ සහ තාවකාලික පියවරක් වශයෙන් යෝග්‍ය තනතුරු සොයා දෙන තෙක් එස් 3-8 වන 45120-10 x1200 -53120 වැටුප් තලයේ 1994.06.01 දින සිට පිහිටුවීමටයි.

නමුත් 20/94 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛනය නිකුත් කිරීම තුළින් 1994.05.11 දින අමාත්‍ය මණ්ඩල පත්‍රිකා වල තීරණවලට පටහැනිව කටයුතු කර ඇති බවට නිරීක්ෂණය වේ.
අමාත්‍ය මණ්ඩල ''සංදේශයේ '' බී මනාපය යනු එස් 3-8 45120-10 x1200 -53120 වැටුප් පරිමාණය වේ. නමුත් ඒ අනුව අමාත්‍ය මණ්ඩල ''තීරණවල '' රු.49,200-12x 1,560 -72,6000 ලබාදෙමින් බී නිර්දේශ ක්‍රියාත්මක කරන ලෙස සඳහන් වුවද, අමාත්‍ය මණ්ඩල තීරණ හා චක්‍රලේඛනවල අපැහැදිලි තත්වයක් ඇති බවට තවදුරටත් නිරීක්ෂණය වේ.

කෙසේ වුවද රාජ්‍ය පරිපාලන හා චක්‍රලේඛන 20/94 අනුව 'බී' මනාපය ක්‍රියාත්මක කර ඇති අතර, එසේ ක්‍රියාත්මක කළ යුත්තේද තාවකාලික පියවරක් ලෙස බව අමාත්‍ය මණ්ඩල තීරණවල සඳහන් වේ. නමුත් පැමිණිලිකරු විශ්‍රාම යනතෙක් ඒ සඳහා සථිර විසඳුමක් ලබාදී නොමැති බවද පැමිණිලිකරුගේ ප්‍රකාශයෙහි සඳහන් වේ.

මෙම ගැටළුව උද්ගතව ඇත්තේ, 1994.07.15 වන දින වන වන අතර, කාලාවරෝධව නොසලකා කොමිෂන් සභාව විසින් මෙම පැමිණිල්ල විමර්ශනයට ලක් කර ඇත. ඊට හේතුව වන්නේ 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ පනත ක්‍රියාත්මක වීමට ප්‍රථම රාජ්‍ය තොරතුරු ලබාගැනීම සෘජු ක්‍රමවේදයක් නොමැති බැවින් අදාළ තොරතුරු ලබාගැනීමට නොහැකිවීම බවට පැමිණිලිකරු විසින් ඉදිරිපත් කර ඇති ප්‍රකාශය අනුව වේ.

**නිගමනය :-**

එසේ හෙයින් ඉහත නිරීක්ෂණ වලට අනුව පැමිණිලිකරුවන්ට අගතියක් සිදු වී ඇති බව තවදුරටත් නිගමනය කරමින් 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 12(1) ව්‍යවස්ථාවෙන් ප්‍රකාශිත නීතිය පසිඳලීම, ක්‍රියාත්මක කිරීම, නීතියේ රැකවරණය ද සර්ව සාධාරණ විය යුත්තේය යන මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

**නිර්දේශය :-**

ඒ අනුව 1971 සිට 1976 දක්වා කාලය තුළ අභ්‍යාසලාභී උපාධිධාරී යෝජනා ක්‍රමය යටතේ 1994.05.18 දින අමාත්‍ය මණ්ඩල තීරණ 41 හි සඳහන් පැමිණිලිකරුවන්ට පෞද්ගලික වනසේ රු.49200-12 x 1560 -72600 අමාත්‍ය මණ්ඩල සංදේශයේ බී මනාපය ක්‍රියාත්මක කළ යුතු බවට මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2022. 11.24 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

රෝහිණී මාරසිංහ,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික),
සභාපතිනී,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු රෝහිණී මාරසිංහ
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

මා.හේ නිමල් කරුණාසිරි,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Dr. M.H. Nimal Karunasiri
Commissioner
Human Rights Commission of Sri Lanka

පිටපත :- 01. අමාත්‍යතුමා, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය, නිදහස් චතුරශ්‍රය, කොළඹ 07. - ඉහත නිර්දේශය අනුව කටයුතු කිරීමට

02. මා.හි.කො.ස ප්‍රාදේශීය කාර්යාලය, මහනුවර.

B/